මගේ අංකය
එමතු இல.
*My No.* විවි/4/2,4,7,8,11,12 ,13

ඔබේ අංකය
உமது இல.
*Your No.*

දුරකථනය
தொலைபேசி
*Telephone* 011-2853615
011-2853777
011-2856201
011-2856202

# ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
# இலங்கைத் திறந்த பல்கலைக்கழகம்
# THE OPEN UNIVERSITY OF SRI LANKA

තැ.පෙ. 21,
නාවල,
නුගේගොඩ.

அஞ்சற் பெட்டி 21,
நாவல,
நுகேகொட.

Post Office Box 21,
Nawala,
Nugegoda.

විද්‍යුත් ලිපිනය - convocation2022@ousl.lk

විභාග අංශය
2023.06.16

ගරු ස්වාමීන් වහන්ස,
ප්‍රිය මහත්මයාණෙනි/මහත්මියනි/මෙනෙවියනි,

## <u>උපාධි ප්‍රදානෝත්සවය - 2022 (II)</u>

**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ 2022 II වෙනි උපාධි ප්‍රදානෝත්සවය 2023 ජූලි 19 වන දින කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී පැවැත්වීමට කටයුතු යොදා ඇත.**

ඔබද මෙම උපාධි ප්‍රදානෝත්සවයේ දී උපාධිය ලැබීම සඳහා සුදුසුකම් ලබා ඇති බව සතුටින් දන්වමි.

උපාධි ප්‍රදානෝත්සවයට සහභාගී වීම සඳහා ආයාචනා පත්‍රය මේ සමග අමුණා ඇත. උපාධිය ලබා ගැනීම සඳහා ආයාචනාපත් ගාස්තු ලෙස රු:4000/- ක මුදලක් ඔබ විසින් ගෙවිය යුතුය. මේ සඳහා වන ගෙවීම් වවුචරපත් https//reginfo.ou.ac.lk/. **වෙතින් බාගත කල හැකිය. නිසි පරිදි සම්පූර්ණ කරන ලද ආයාචනා පත්, ගෙවීම් කල පසු ලැබෙන ලදු පතේ පිටපතක් සමග "සහකාර ලේඛකාධිකාරී - විභාග, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය, නාවල නුගේගොඩ " යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නැතහොත් 2023.06.25 දින ප.ව.04.00 ට පෙර විශ්වවිද්‍යාලයේ නාවල පිහිටි විභාග අංශයට පැමිණ භාරදීම කළ හැකි ය.**

<u>**2023.06.25 දිනට පසු ලැබෙන අයදුම් පත් මෙම උපාධි ප්‍රදානෝත්සවය සඳහා සලකා බලනු නොලැබේ.**</u>

මේ සම්බන්ධ සියලුම ගෙවීම් නාවල, නුගේගොඩ, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ සරප් වෙත හෝ මහජන බැංකුවේ ඕනෑම ශාඛාවක දී, මහජන බැංකු නුගේගොඩ ශාඛාවේ ඇති ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ අංක 0174-1001-5-1189657 දරණ රැස් කිරීමේ ගිණුමට බැර කළ හැකි ය. මාර්ගගත ක්‍රමයට ගෙවීම් කරන්නේ නම් ඒ සඳහා වන ගෙවීම් වවුචරපත් https//reginfo.ou.ac.lk/. **වෙතින් බාගත කල හැකිය.** තවද එම ගෙවීම් වවුචරයේ (දෙවන පිටපත) එනම් විශ්වවිද්‍යාල පිටපත අදාල ආයාචනා පත්‍රය සමග අමුණා එවිය යුතුය. යථෝක්ත ගාස්තු වෙනුවෙන් චෙක්පත්, තැපැල් ඇණවුම් හෝ මුදල් ඇණවුම් භාර නොගන්නා බව කරුණාවෙන් සලකන්න.

**උපාධි ප්‍රදානෝත්සවයට සහභාගී වන හෝ සහභාගී නොවන, අදාල සියළුම උපාධි ලාභීන් මෙම ආයාචනා පත්‍රය සම්පූර්ණ කර අදාල මුදල් ගෙවූ බවට වන වවුචර්පත සමග එවිය යුතු අතර එසේ කිරිමට අපොහොසත් වන කිසිදු උපාධි ලාභියකුට සහතික නිකුත් නොකරන බැවින්, නිසි පරිදි සම්පූර්ණ කරන ලද ආයාචනා පත්‍ර සමඟ අදාළ තොරතුරු නියමිත දිනට (2023.06.25 ) ප.ව.04.00 ට පෙර ලබාදීමට කාරුණික වන්න.**

තවද ඔබ විශ්වවිද්‍යාලයේ පුස්තකාලයෙන් පොත්පත් ලබාගෙන ඇත්නම් ඒවා ද මෙදිනට පෙර ආපසු බාරදිය යුතුය.

මෙයට අදාල විස්තර සහිත ලිපිය යථාකාලයේ දී ඔබ වෙත ලැබෙනු ඇත.

සහකාර ලේඛකාධිකාරී/විභාග
ලේඛකාධිකාරී වෙනුවට.

1. ඔබ උපාධි ප්‍රදානෝත්සවය සඳහා **නොපැමිණියද** විශ්වවිද්‍යාලයට අයවිය යුතු යම් මුදලක් හෝ උපාධි ප්‍රදානෝත්සවය සඳහා වූ ගාස්තු ගෙවීමට ඇත්නම් එය 2023.06.25 වෙනි දිනට පෙර ගෙවීමට පියවර ගත යුතු වේ. එම හිඟ මුදල පියවනතුරු උපාධි සහතිකය ලිවීමට අවකාශ නොමැති බව කරුණාවෙන් සලකන්න.

2. ඔබ මෙම විශ්වවිද්‍යාලයේ පුස්තකාලයෙන් පොත්පත් ලබාගෙන ඇත්නම් ඒවා 2023.06.25 වන දිනට පෙර ආපසු බාරදිය යුතුවේ.

3. ඔබ මෙම විශ්වවිද්‍යාලයේ ලියාපදිංචි වන අවස්ථාවේදී සහ පාඨමාලාව හදාරණ අවස්ථාවේදී සඳහන් ආකාරයට ඔබේ නම නිවැරදිව ආයාචනා පත්‍රයෙහි සඳහන් කළ යුතුය.

4. ඔබ ලියාපදිංචි වන අවස්ථාවේ අයදුම්පතේ සඳහන් කළ නම සහ ඔබගේ නිවැරදි නම අතර වෙනසක් වේ නම් ඒ බව සනාථ කිරීමේ ලියවිලි (උප්පැන්න සහතිකයේ පිටපතක්) අමුණන්න.

5. ඔබගේ යම් ප්‍රමාද දෝෂයක් නිසා ඔබගේ නම වැරදි අයුරකින් සහතිකයේ සඳහන් වුවහොත්, නැවත සහතිකයක් නිකුත් කරනුයේ රු:1000.00 ක අතිරේක මුදලක් අය කිරීමෙන් පසුව වන අතර 2023.07.30 වන දිනෙන් පසුව එම සහතික නිකුත් කරනු නොලබන බව කරුණාවෙන් සලකන්න.

---

**ආයාචනා පත්‍රය පිරවීම සඳහා උපදෙස් (අදාල ආයාචනා පත්‍රය ඉංග්‍රීසි භාෂාවෙන් සපයා ඇත.)**

සියළුම තොරතුරු නිවැරදිව හා පැහැදිලිව සම්පූර්ණ කළයුතු වේ.

1. වැඩසටහනේ නම (ඉංග්‍රීසියෙන්) ලියන්න.
2. නම මුලකුරු සහිතව (ඉංග්‍රීසියෙන්) ලියන්න.
3. සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) ලියන්න.
4. මුලකුරු සමග නම (සිංහල/දෙමළ) භාෂාවෙන් ලියන්න
5. සම්පූර්ණ නම( සිංහල/දෙමළ) භාෂාවෙන් ලියන්න
6. ලියාපදිංචි අංකය සඳහන් කරන්න.
7. දුරකතන අංක නිවස/ජංගම/කාර්යාලයීය සපයා ඇති ස්ථානවල සඳහන් කරන්න.
8. විද්‍යුත් තැපැල් ලිපිනය සඳහන් කරන්න.
9. උපාධි ප්‍රදානෝත්සවයට පැමිණ සහතිකය ලබාගන්නවාද/ එසේ නැතහොත් නොපැමිණ සහතිකය ලබා ගන්නවාද යන වග අදාල කොටුවේ X ලකුණින් සඳහන් කරන්න.
10. මුදල් ගෙවීම - මහජන බැංකුවට හෝ විවෘත විශ්වවිද්‍යාලයට ගෙවීම් කිරීමෙන් පසු අදාල තොරතුරු නියමිත ස්ථානවල සටහන් කරන්න. ( මුදල, දිනය, බැංකු ශාඛාව හා විවෘත විශ්වවිද්‍යාලයට ගෙවීම් කලේ නම් ලදුපත් අංකය සඳහන් කරන්න.)

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ අතුරු ව්‍යවස්ථා, රෙගුලාසි හා නීතිරීති මාහට අදාල වන ප්‍රමාණයට අවංකව පිළිපදින බවටත්, ------------------------------------------------------------------------------------------------------------ (අදාල පාඨමාලාවේ නම සඳහන් කරන්න.) උපාධිය මෙතෙක් මා වෙත පිරිනමා නොමැති බවටත්, මට ප්‍රදානය කිරීමට යන වරප්‍රසාද විවෘත විශ්වවිද්‍යාලය අපකීර්තියට ලක්වන පරිදි ප්‍රයෝජනයට නොගන්නා බවටත්, මම ගෞරව බහුමානයෙන් යුක්තව මෙයින් ප්‍රකාශ කරමි.

දිනය -----------  ------------------------------

අයදුම්කරුගේ අත්සන

^ උපාධි ලාභියා විසින්ම අත්සන් කළයුතුය.)